සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 10 - ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය - I,II

කාලය: පැය 03 යි.

නම / විභාග අංකය .................................   අමතර කියවීම් කාලය මි : 10 කි.

### සිංහල භාෂාව හා සාහිත්‍යය - I

සැලකිය යුතුයි.

- සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් ලැබේ.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය ලියන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

- අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

01. සිදු වූ අනතුර පිළිබඳ ව විමසන විට සහන් **ගල් ගිල්ලා වාගේ** බලා සිටින්නට විය.
(1) විස්මිත ව (2) නිශ්ශබ්ද ව (3) කෝප ව (4) ඍජු ව

02. ඇතැම් නිලධාරීන් තමා ඉදිරියේ මවා පෑම් කොට **ලකුණු දමා ගැනීමට** උත්සාහ කරන බව ලේකම් තුමා ප්‍රකාශ කළේ ය.
(1) වංචා කිරීමට (2) ජය ලැබීමට (3) ප්‍රශංසා ලැබීමට (4) වැඩ කිරීමට

03. ඔහුගේ යෝජනාව පිළිබඳ කළමනාකාරතුමා **එක පයින්** කැමැත්ත ප්‍රකාශ කළේ ය.
(1) ඒකමතික ව ම (2) නො විමසා ම (3) සැමදා ම (4) ස්ථිර ව ම

- අංක 04 සිට 06 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

04. .......................................... සමාජයක් තුළින් රටේ ඉදිරි ගමන අපේක්ෂා කළ යුතු බව උන්වහන්සේ පැවසූහ.
(1) විශේෂිත (2) උපලක්ෂිත (3) සුපෝෂිත (4) ශික්ෂිත

05. එක් එක් අය තම අභිමතය පරිදි කටයුතු කිරීම නිසා තත්ත්වය වඩාත් .................................... විය.
(1) ආකුල (2) නිරාකුල (3) නිරනුකුල (4) ව්‍යාකුල

06. සිසුන් ඇතුළුවීමට පෙර පාසල් ....................................... විෂබීජහරණය කළ යුතු යැ'යි සෞඛ්‍ය පරීක්ෂකවරයා උපදෙස් දුන්නේ ය.
(1) පරිශ්‍රය (2) වටපිටාව (3) වාතාශ්‍රය (4) පන්ති කාමර

07. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) ප්‍රවනතා, උත්කෘෂ්ට, උළුවස්ස, ආචාර්‍ය
(2) අරුණලු, ජ්‍යෙෂ්ඨ, පෘථිවිය, යුහුසුළු
(3) භීෂණය, වීරෝදාර, සම්ප්‍රේශණ, සමස්ත
(4) ස්වාභාවික, ළතැවුල්, හෘදයංගම, පෞරුෂය

08. මූලාකෘති, ඍහැන, සාමකාමී, මීවදය යන වචනවල **පළමු අකුරෙහි** අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) දීර්ඝ පාපිල්ල, කෙටි පාපිල්ල, ඇලපිල්ල හා දීර්ඝ ඉස්පිල්ල
(2) දීර්ඝ පාපිල්ල, කෙටි ඇදපිල්ල, ඇලපිල්ල හා දීර්ඝ ඉස්පිල්ල
(3) කෙටි පාපිල්ල, කෙටි ඇදපිල්ල, ඇලපිල්ල හා කෙටි ඉස්පිල්ල
(4) කෙටි පාපිල්ල, කෙටි පාපිල්ල, ඇලපිල්ල හා දීර්ඝ ඉස්පිල්ල

09. **නල** යන පදයෙහි අන්තර්ගත අක්ෂර වර්ගය වන්නේ,
(1) ඕෂ්ඨජ ය. (2) තාලුජ ය. (3) දන්තජ ය. (4) මූර්ධජ ය.

10. අකාරාදී පිළිවෙළ **නිවැරදි ව** දැක්වෙන පද පේළිය තෝරන්න.
(1) දිනමිණ, දිවයින, රාවය, ලංකාදීප
(2) දොඩම්, ජම්බු, මැංගුස්, කෙසෙල්
(3) ඉතිහාසය, ගණිතය, සිංහල, විද්‍යාව
(4) මහාසාර, මනමේ, සිංහබාහු, රත්තරන්

11. අනුක්ත නාම පද **පමණක්** යෙදී ඇති වරණය තෝරන්න.
(1) දරුවකු, ගැහැනියක්, ගොවීන්, ගායකයකු
(2) සංචාරකයන්, දෙවියකු, වයන්නෝ, සිංහයන්
(3) විශිෂ්ටයකු, ඇතින්නක, රජවරුන්, කම්කරුවෝ
(4) කාන්තාවක, කුරුල්ලකු, අප, ඇත්ගොව්වන්

12. උපසර්ග පදයක් ඇතුළත් **නොවන** පදයක් සහිත වරණය තෝරන්න.
(1) පබල, සබඳ, පිරිසුදු, අතිමහත්
(2) අපගමන, පිළිකුල, නිදොස්, පිණිස
(3) සුගන්ධ,දුෂ්කර, අනුලෝම, සංවත්සර
(4) ප්‍රතිචාර, සත්පුරුෂ, අභිමාන, අවමන්

13. සිංහලයන්ගේ භාෂාව වූකලී වාග් ශක්තියෙන් අනූන වූ, එය කතාකරන ජනතාව මෙන් ම ශ්‍රේෂ්ඨ වූ, සුලලිත සුබනම්‍ය, සුමධුර භාෂාවකි.
මෙම වාක්‍යයේ **වූකලී** යන පදය,
(1) විභක්ති පදයකි. (2) සමාස පදයකි. (3) නිපාත පදයකි. (4) උපසර්ග පදයකි.

14. මුලින් යෙදුණු අක්ෂර වර්ගයට අයත් අකුරක් **නොයෙදුණු** වචනය සහිත පිළිතුර තෝරන්න.
(1) අන්තඃස්ථාක්ෂර - නිර්දය, වස්සානය, මුකුලිත, සම්මානය
(2) වර්ගාන්ත අක්ෂර - මමත්වය, දරනවා, හෙණ්ඩුව, ලාඤ්ඡනය
(3) අල්පප්‍රාණ අක්ෂර - ජනතාව, සංවාද, මර්දනය, උදව්වක්
(4) ඌෂ්මාක්ෂර - ෆීනික්ස්, මුලකුරු, සාතිශය, සංරචක

15. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් **නොවන** පදයක් සහිත වරණය තෝරන්න.
(1) පූර්ව ක්‍රියා - බැස, ගොස්, කා, නටා
(2) සන්ධි - උනුන්, මිනිසෙක්, අරුණලු, අවස්ථා
(3) යුගල පද - ශුද්ධ පවිත්‍ර, අහු මුලු, හඬා දොඩා, රොස් පරොස්
(4) තද්ධිත - පවිත්‍රත්ව, ප්‍රවීණතා, විශේෂත්ව, සුහදතා

16. **අසම්භාව්‍ය ක්‍රියාවක්** යෙදී ඇති වාක්‍යය කුමක් ද?
(1) හිරු බැස යද්දී අපි මුහුදු වෙරළ කරා පිය මැන්නෙමු.
(2) සංචාරකයෝ සොබා සිරිය නරඹමින් සතුටු වූහ.
(3) සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කිරීමේ අවශ්‍යතාව එහිදී අවධාරණය විය.
(4) නිළිය වේදිකාවෙන් බැස අවුත් ප්‍රේක්ෂකයන් ඇමතුවා ය.

- **අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.**

17. නිතර නිතර විදුලිය ඇනහිටීම නිසා **ස්වයංක්‍රීය** විදුලිජනක යන්ත්‍රයක් මිල දී ගැනීමට ඔහු තීරණය කළේ ය.
(1) වේගයෙන් ක්‍රියා කරන (2) සෙමින් ක්‍රියා කරන (3) ඉබේ ක්‍රියා කරන (4) නිතර ක්‍රියා කරන

18. ඔහු වඩාත් ප්‍රියතාවක් දැක්වූයේ **චිරන්තන** සාහිත්‍ය කෘති පරිශීලනය සඳහා ය.
(1) නූතන (2) අද්‍යතන (3) සනාතන (4) පුරාතන

19. පුද්ගලයන් දෙදෙනෙකු අතර **දූරස්ථභාවය** රැක ගැනීම වසංගත රෝගයෙන් මිදීම සඳහා ගත යුතු එක් පියවරක් වේ.
(1) දුරින් ගමන් කිරීම (2) දුරින් පිහිටා සිටීම
(3) දුර සිට බැලීම (4) දුරදිග බලා ක්‍රියාකිරීම

20. දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් හා බැඳී නොපවත්නා පද පේළිය තෝරන්න.

(1) කච්චිචිය, අල්මාරිය, පුටුව, අටුව (2) පලු, වීර, කීන, මොර
(3) බැනියම, චේට්ටිය, සරම, රෙද්ද (4) ථූපවංසය, දාඨා වංසය, මහාවංශය, චූලවංශය

21. එක් එක් පද පේළියේ දී ඇති පදවලට **සමානාර්ථ යෙදුම්** පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.

| | |
|---|---|
| (1) | වතුර - උදක, අත - හස්ති, ලෝකය - ජගත්, ගත - ග්‍රන්ථය |
| (2) | දෑ - ජාති, සුදු - ධවල, දියනෙත - චන්ද්‍රයා, සිත - සන්තානය |
| (3) | නිතර - සතත, අනංග - මල්මී, මව - දිනිති, ඇස - ලෝචන, |
| (4) | උපද්‍රව - කරදර, ගස - පාදප, කුඩය - සත, වත - කතාව |

22. මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) අහස - ගුවන, ගගන, නුබ, පවන් මග (2) නෙලුම් මල් - අරවින්ද, කමල්, කුසුම්, පංකජ
(3) සිරුර- කය, ගත, වෙර, තුනු (4) වනය - අරණ, බැද්ද, වල, ආරණ්‍යය

23. විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් **නොවන** වරණය තෝරන්න.
(1) ස්වාභාවික - කෘත්‍රිම (2) සාවද්‍ය - නිරවද්‍ය (3) දුර්වර්ණ - වෛවර්ණ (4) ප්‍රාචීන - ප්‍රතිචීන

24. වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න.
(1) අන්තඃස්ථාක්ෂර අඝෝෂාක්ෂර නමින් ද හැඳින්වේ.
(2) තෙමේ යන්න පුරුෂ ලිංග ඒකවචන පදයකි.
(3) ප්‍රවීණත්ව යන්න තද්ධිත නාම පදයකි.
(4) අති + අලංකාර යන්න සන්ධි වනුයේ අත්‍යලංකාර යනුවෙනි.

25. විරාම ලක්ෂණ **නිවැරදි** ව දැක්වෙන වාක්‍යය තෝරන්න.
(1) ක්‍රි ෑ වෑ 1412 , 1580 සවන පරාක්‍රමබාහු රජ දවස හංස සන්දේශය ලියැවිණි.
(2) රත්තරන් දරුවනේ; රෝගවලින් ආරක්ෂා වීමට පිරිසිදුබව ආරක්ෂා කර ගත යුතු බව දන්නවා ද?
(3) "නැගී සිටුව! ආචාරීනි, මා නොවඳුව"
(4) ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යනුවෙන් නම සඳහන් සුදු පැහැ වෑන් රියක් පන්සල් මිදුලේ නතර කර තිබිණි.

- **අංක 26, 27 ප්‍රශ්න යටතේ දී ඇති අදහසට වඩාත් ම ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.**

26. 'සදාචාරවත් වීම ඉතා වටී.'
    (1) කැත්ත කැපෙන්නේ කරෙන් කැඩෙන්න ය.
    (2) ක්‍රියාව හොඳ නම් ශ්‍රියාව ද එය ම ය.
    (3) කොතන ද කාසි එතනට වාසි
    (4) උපාය දන්නෝ අපායේ නො වැටෙති.

27. 'නරක මිනිස්සු උතුමන්ටත් ගරහති.'
    (1) උගත් බුද්ධිමත් අය කලබල නො වෙති.
    (2) බුද්ධිමතුන් නැති තැන අඩු උගත්කම් ඇත්තෝ ඉස්මතු වෙති.
    (3) හඳටත් බල්ලෝ බුරති.
    (4) දැන උගත්කම් මගින් ගරු සරු ලබන්න.

28. ස්වර සන්ධිය හා පරස්වර ලෝප සන්ධියට අදාළ නිදසුන් පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
    (1) මඟුලැතා, සුරඟන (2) මුනිතුමා, සුරඟන
    (3) මඟුලැතා, දකුණත (4) සුරඟන, මුනිතුමා

- අංක 29, 30 යටතේ දී ඇති ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූල ව නිවැරදි** වාක්‍යය තෝරන්න.

29. (1) ඔවුහු මෙහි පැමිණීම යෙහෙකි.
    (2) ක්‍රීඩකයෝ හෙට හොඳින් ක්‍රීඩා කරනු ඇත.
    (3) දරුවෝ  අපේක්ෂා කරන්නේ මොනවා ද?
    (4) වෛද්‍යවරු දෙදෙනෙක් රැස්වීමට පැමිණියහ.

30. (1) ඔහු දක්ෂ පිහිනුම් ශූරයෙකු ද?
    (2) අප ඉවසීමෙන් කටයුතු කළ යුතු වෙමු.
    (3) නුඹ ශ්‍රේෂ්ඨ දරුවෙක්ලු.
    (4) රටවැසියෝ නීතිගරුක විය යුත්තේ ය.

31. 
    - ගාල්ල .................................... ඇති සියලු දුම්රිය ස්ථානවල එම දුම්රිය නවත්වන ලදී.
    - ඉතා විනීත දරුවන් .............................. ඔවුහු තරගයට ඉදිරිපත් වූහ.
    - උදෑසන මහ වැසි වැටුණු ......................... ගමන තරමක් ප්‍රමාද විය.
    - කුමාරතුංගයෝ දරුවන්  ........................... ග්‍රන්ථ රැසක් රචනා කළහ.

    ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය වාක්‍ය අනුපිළිවෙළ කුමක් ද?
    (1) දක්වා, නිසා, මෙන්, උදෙසා (2) දක්වා,  මෙන්,  නිසා, උදෙසා
    (3) නිසා, උදෙසා, දක්වා, මෙන් (4) මෙන්, දක්වා, උදෙසා, නිසා

32. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් **නිවැරදි** වන්නේ කුමක් ද?
    "ශ්‍රී ලාංකිකයෝ හරි සංග්‍රහශීලී මිනිස්සු."
    (1) ශ්‍රී ලාංකිකයෝ බොහෝ සංග්‍රහශීලී මිනිස්සු වෙති.
    (2) ශ්‍රී ලාංකිකයෝ බොහෝ සංග්‍රහශීලී මිනිසුන් වෙති.
    (3) ශ්‍රී ලාංකිකයන් බොහෝ සංග්‍රහශීලී මිනිසුන් වෙති.
    (4) ශ්‍රී ලාංකිකයන් බොහෝ සංග්‍රහශීලී මිනිස්සු වෙති.

33. 'මං තනන්නෝ' කෙටිකතාවේ රචකයා වනුයේ,
    (1) දයාසේන ගුණසිංහ ය. (2) ගුණදාස අමරසේකර ය.
    (3) කේ. ජයතිලක ය. (4) මහගම සේකර ය.

34. වගාවට හානිකරන සතුන් පළවා හැරීම සඳහා යොදා ගන්නා උපක්‍රමයක් **නොවන්නේ** මින් කුමක් ද?
(1) සොකඩ බැඳීම (2) කුරුලු පාළුව
(3) දිය හොල්මන (4) සේරංගාව

35. "එකල්හි අනඳ මහතෙරහු බුදුන් කෙරෙහි බලවත් සෙනෙහෙයෙන් අධිවාසනා නො කටැහී.." යන පාඨයෙහි 'අධිවාසනා ' යන්නෙහි අර්ථය කුමක් ද?
(1) විශ්වාසය (2) අවංකත්වය (3) මිත්‍රත්වය (4) ඉවසීමේ ගුණය

36. පහත සඳහන් කවියෙහි තුන්වැනි පදය තෝරන්න.
එවන් ලෙයින් උපන් පුතේ
සුරු විරුකම් ඔබට ඇතේ
......................................................................
මව්බිම දෙස බලන් පුතේ

(1) දෑ උරුමය ඇති ව සිතේ (2) ඒ මහ වැව් බැඳුණෙ පුතේ
(3) දහදිය නොම සැලෙන ගතේ (4) ඉදි කළ වැව් බලන් පුතේ

37. විදිමින් සවස නල හැසිරෙන දිගතු වල
සොබමන් සුනිල් මිණි නිල් නුබ තුර විපුල
පතසන් අවරගිර නැටියෙන් වැටෙන කල
විලිකුන් සුරත් පල වැනි වේ රිවි මඬල
මෙම පද්‍යය අයත් සන්දේශය වන්නේ,
(1) ගිරා සන්දේශය. (2) කෝකිල සන්දේශය.
(3) සැලලිහිනි සන්දේශය. (4) පරෙවි සන්දේශය.

38. කමත් බස් වහරේ දී කපා දැමූ කුඩා ගොයම් කැටි හඳුන්වන්නේ,
(1) මාප් පිඩ යනුවෙනි. (2) උප්පිඩි යනුවෙනි.
(3) ගොයම් කොළය යනුවෙනි. (4) ගොයම් මිටි යනුවෙනි.

39. සූරිය මල අහස් තලේ සිනා මවන
හිමිදිරියේ
අග නගරේ
මහ වීදියෙ
මං සන්දියෙ
කාර් - වෑන් - බස් පෙරහැර
ගල් ගැහුණා
එක පාරට!

මෙම පද්‍ය ඛණ්ඩයෙන් කියැවෙන්නේ,
(1) රිය අනතුරක් පිළිබඳ ව ය. (2) වාහන තදබදයක් පිළිබඳ ව ය.
(3) නගරයේ ඇති ඝෝෂාකාරී බව පිළිබඳ ව ය. (4) නගරය රථවාහනවලින් පිරී පැවති බව ය.

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරන්න.
පොදු පාඨකයාගේ උනන්දුව දල්වන අගයකින් යුතු පුවත්පත් ලිපි වර්ගයක් වූ විශේෂාංග ලිපි නිර්මාණාත්මක ගුණයෙන් ද යුක්ත විය යුතු ය.
(1) පාඨක උනන්දුව ඇති කරවන,නිර්මාණාත්මක ගුණයෙන් ද යුක්ත විය යුතු පුවත් පත් ලිපි වර්ගයකි, විශේෂාංග ලිපි.
(2) නිර්මාණාත්මක ගුණයෙන් යුතු විශේෂාංග ලිපි කියවීමට පාඨකයන් උනන්දු විය යුතු ය.
(3) ලේඛකයන් නිර්මාණාත්මක විශේෂාංග ලිපි කියවීමට පාඨකයන් උනන්දු කළ යුතු ය.
(4) පාඨකයන් නිර්මාණාත්මක ගුණයෙන් යුතු විශේෂාංග ලිපි උනන්දුවෙන් පරිශීලනය කළ යුතු ය.

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 10 - ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය

නම/විභාග අංකය :- ........................................................

### සිංහල භාෂාව හා සාහිත්‍යය - II

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

(01) අංක (I) සිට (X) දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

"ත්‍යාග ප්‍රධානෝත්සවය සඳහා පැමිණි ආරාධිත අමුත්තා විශේෂ ලේඛණයක සටහනක් තැබුවේ ය."

(ii) පහත සඳහන් පද සන්ධි කර ලියන්න.

(අ) පිළි + උතුරු (2) පූජා + උත්සව

(iii) පහත සඳහන් වාක්‍යවල තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් වන ක්‍රියා වර්ගය ලියන්න.

(අ) තාත්තා මෙහෙකරුවා ලවා වැට **බන්දවයි.**

(ආ) ඔහු පොත **හකුළා** හාන්සි පුටු අත මත තබා මිදුලට බැස්සේ ය.

(iv) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් **නිපාත පද දෙකක්** උපුටා ලියන්න.

"දරුවන් පාසල් ඇරී නිවසට එන තුරු මව ඉතා විමසිලිමත් ව බලා සිටියා ය."

(v) පහත දැක්වෙන පදවලට **විරුද්ධාර්ථවත්** පදය බැගින් ලියන්න.

(අ) බහුල (ආ) විවෘත

(vi) පහත සඳහන් (අ) සහ (ආ) හි දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා **නිදොස් කර** නැවත ලියන්න.

(අ) ශිෂ්‍යයන් දෙදෙනෙක් ඔවුන් බේරා ගත්හ.

(ආ) සුජාතා තොමෝ කිරිපිඬු පූජා කිරීම පිණිස ගියහ.

(vii) පහත සඳහන් අදහස්වලට ගැළපෙන **තනිපදය** බැගින් ලියන්න.

(අ) ලෙඩ රෝග බෝ වෙමින් පැතිර යාම -

(ආ) වර්තමානයට සරිලන සේ සැකසීම -

(viii) පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය **දෙකක්** ලියන්න.

(අ) පැල (2) පැළ

(ix) පහත සඳහන් වාක්‍ය දෙක **කර්මකාරකයට** හරවා ලියන්න.

(අ) අපි නුඹ අගය කළෙමු.

(ආ) වෙළෙන්දා බඩු විකුණයි.

(x) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් **යුගල පද දෙක** උපුටා ලියන්න.

"දරුවන්ගේ ඕනෑ එපාකම් සපුරාලීමට අවශ්‍ය නිසා ඔහු දිවා රෑ වෙහෙසී වැඩ කළේ ය."

(ලකුණු 02 × 10 = 20 යි)

(02). පහත දැක්වෙන **(අ), (ආ), (ඉ), (ඊ)** යන විස්තර අතුරෙන් **එකක්** තෝරා ගෙන වචන **250කට** නො අඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා **යෝග්‍ය මාතෘකාවක්** ද යොදන්න.

(අ) ඕනෑ ම පුද්ගලයකුගේ ළදරු විය ඔහුගේ හෝ ඇයගේ ඉදිරි දිවියේ අත්තිවාරම වෙයි. පාසලට පිය නැගීමට පෙර, පෙරපාසලට දරුවා යොමු කරන්නේ ඊට ඇවැසි වටපිටාව සකස් කිරීමටයි.එහෙත් අද වන විට ඇතැම් දෙමාපියන් පෙරපාසලෙන් අසීමිත විෂය ධාරාවක් ආවරණය වෙතැයි අපේක්ෂා කිරීම අවාසනාවකි. පෙර පාසල් අනිවාර්ය අධ්‍යාපනයට ඇතුළත් නොවන අතර ගුරු භවතුන්ට අවශ්‍ය විධිමත් පුහුණුව හා සම්පත් ලබාදී පෙර පාසල් විධිමත් කිරීම කාලීන අවශ්‍යතාවක් ව පවතී.

(ආ) දුරාතීතයේ සිට ශ්‍රී ලාංකිකයෝ නිරෝගී බව රැක ගත්තෝ වූහ. ඔවුන්ගේ ආහාර රටාව, පවිත්‍රත්වය ආදී බොහෝ කරුණු ඊට හේතු විය. අද වන විට අප රටේ ජනගහනයෙන් බහුතරයක් බෝ වන හෝ බෝ නොවන ලෙඩ රෝගවලට ගොදුරු වීම සාමාන්‍ය දෙයක් බවට පත් ව ඇත. මීට බලපා ඇති හේතු රාශියක් වෙයි. ඇතැම් පවුලකට උපයන ආදායමෙන් වැඩි මුදලක් වෛද්‍ය ප්‍රතිකාර සඳහා වැය කිරීමට සිදු ව ඇත. රටේ ප්‍රගමනය උදෙසා නිරෝගී ජාතියක අවශ්‍යතාව පිළිබඳ සලකා කටයුතු කිරීම අත්‍යවශ්‍ය ය.

(ඉ) ශ්‍රී ලංකාව විවිධ ආගම් අදහන ජාතීන් වෙසෙන රටකි. අදහන්නේ කිනම් ආගමක් වුව ද එම ආගම් අතර සමගිය රටේ දියුණුවට හේතු වෙයි. අවස්ථාවාදී, බලකාමයෙන් පිරුණු ඇතැම්හු ආගමික වශයෙන් අප බෙදී සිටිනවාට කැමත්තක් දක්වති. ඕනෑ ම අයෙකුට තමා කැමති ආගමක් ඇදහීමට ඇති අයිතිය අගය කළ යුතු සේ ම කිසියම් ආගමක් අවි බලයෙන් ප්‍රචාරය කිරීමට ඉඩ නො දිය යුතු ය. අන්‍ය ආගම් පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීමත්, සියලු ආගම්වල ඉගැන්වෙන ආගමික සහජීවනය ඇගයීමත් කළ යුතු ය.

(ඊ) වසංගත තත්ත්වය රට පුරා ක්‍රමයෙන් ව්‍යාප්ත වීමත් සමඟ අප වෙත සංචරණ සීමා පැනවෙන්නට විය. පාසල් වසා දැමූයෙන් නිවසට වී සෞඛ්‍යාරක්ෂිත ව සිටීමට දරුවන්ට සිදු විය. නිකරුණේ ගෙවී යන කාලය ඵලදායී ලෙස යොදා ගත යුතු බව වැටහී ගියේ දින දෙක තුනක් ගෙවී යන විට ය. පොත් පත් පරිහරණයටත්, හරවත් රූපවාහිනී වැඩසටහන්වලට යොමුවීමටත්, පාසල මගින් ලබා දෙන අධ්‍යාපන කටයුතුවල නිරතවීමටත්, තවත් විටෙක ගෙවතු වගා සහ ක්‍රීඩා ආදියට යොමු වෙමින් ගත කළ විශේෂ නිවාඩුව පාසල් දරුවන්ට අර්ථවත් එකක් විය

(ලකුණු 25යි)

(03). පහත දැක්වෙන පාඨය වචන 45 - 55 අතර වන සේ **සාරාංශ කොට** ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

වර්තමානයෙහි අප රටෙහි භාෂා සාහිත්‍යයන් පිළිබඳ ව පවතින්නේ ඇල් මැරුණු ස්වභාවයකි. උදාසීන ගතියකි. එයිනුදු සිංහල භාෂා සාහිත්‍යය විශේෂ වේ. භාෂාව, සාහිත්‍යය ගැන අවධානය යොමු කිරීමෙන් ඇති ඵලය කුමක් දැයි කවුරුත් කල්පනා කරන්නා සේ ය. එහෙත් එහි අනිසි ඵල ශ්‍රී ලාංකේය සමාජය තුළ දැනටමත් පෙනෙන්නට පටන් ගෙන ඇත. වරෙක සකු පඬිවරයෙක් සාහිත්‍ය කලා විහීන මිනිසා තිරිසනෙකුට සමාන කළේ ය. තණකොළ නො බුදින්නේ හරකුන්ගේ පිනට යයි ඔහු කීවේ ය. අයි.බී. හෝනර් නැමැති බටහිර පඬිවරිය ජාතක කතා පනහක් කියවූ මිනිසා පිරුණු මිනිසෙකැයි කීවා ය. ඔවුන් එසේ කීවේ සාහිත්‍යයෙහි ඵල දන්නා මිනිසුන් හැටියට ය. වර්තමානයෙහි අප රට තුළ සිදුවන අපරාධ සහ අනෙකුත් දුරාචාරයන් දෙස බලන විට අප සාහිත්‍යයෙන් ඈත් වීමේ ඵල නො පෙනේ ද?

සිංහලයන්ගේ ජාතික අනන්‍යතාවෙහි මුල් ලකුණ වනුයේ මවුබසයි. සිංහලයයි. සිංහල සාහිත්‍යයයි. එය පිරිහී ගිය කල අපේ යයි කිව හැකි බසක් සාහිත්‍යයක් අපට නැති ව යනු ඇත.

(ලකුණු 10යි.)

(04). පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු** සපයන්න.

කොළඹ කවීන් පැරණි කවිසමය නොතකන පිරිසක් වුව ද ඒ කවිසමයෙන් සහමුලින් මිදීමට සමත් වූ පිරිසක් නොවූ බව අපට පෙනෙන්නට තිබේ. කෝට්ටේ යුගයේ කවීන්, පැරණි කවීන් විසින් බෙහෙවින් වහරන ලද දහඅට මත් සිව්පදය - දායාදය ඉවතලීමට ඔවුහු අසමත් වූහ. අවිඥානික ව මෙන් ලත් ඒ දායාදය ඔවුන්ගෙන් වැඩි දෙනෙකු කිසිදු වග විභාගයකින් තොර ව, කිසිදු විචාරයකින් තොර ව සිය ප්‍රධාන ආකෘතිය බවට පත් කර ගන්නා ලදී. එයින් හොඳක් මෙන් ම නරකක් ද සිදු වූ බව පෙනේ. එයින් සිදු වූ හොඳ නම් කොළඹ කවීන් අතර වූ වැඩි ප්‍රතිභා ශක්තියකින් යුතු වූ කවීන්ට ඒ දහඅට මත් ඡන්දස ඔස්සේ තමන්ට ඇවැසි විරිතක් තනා ගැනීමට හැකි වීමයි. මෙහිදී යසෝදරවත වැනි ජනකවීන්ගේ නිර්මාණ ඔවුන්ට බලපාන්නට ඇතැයි සිතේ. කේයස්, කුමාරගම ආදී වූ කවීන් ලියා ඇති සාර්ථක පද්‍ය රචනා අතළොස්ස ලියා ඇත්තේ දහඅට මත් ඡන්දසට අයත් සමුදුරුගොස් විරිතට වෙනස් විරිතක් මඟින් බව අපට පෙනී යා යුතු ය. කේයස් ලියා ඇති 'කණ උන්දෑ' පද්‍යයෙන් මේ කරුණ මනාව වටහා ගත හැකි ය.

(i) පැරණි කවි සමය පිළිබඳ කොළඹ කවීන් තුළ වූ ලක්ෂණ <u>දෙකක්</u> ලියන්න.
(ii) කෝට්ටේ යුගයේ පැරණි කවීන් වඩාත් භාවිත කළ සිව්පදය කුමක් ද?
(iii) මෙහි යසෝදරවත හඳුන්වා ඇත්තේ කිනම් සාහිත්‍ය ග්‍රන්ථයක් ලෙස ද?
(iv) කේයස්ගේ 'කණ උන්දෑ' පද්‍යයෙන් මනාව වටහා ගත හැකි යයි සඳහන් වන්නේ කුමක් ද?
(v) පහත සඳහන් පදවලට සමාන පද ඡේදයේ උපුටා ලියන්න.
(අ) දෑවැද්ද -
(ආ) සුළු ප්‍රමාණයක් -

(ලකුණු 2 × 5 =10යි )

(05). විසිතුරුගම 'රන්තරු' ළමා සමාජය රූපවාහිනී ළමා වැඩසටහනක් සඳහා ඉදිරිපත්වීමට අපේක්ෂා කරයි. ගායන, නර්තන, කෙටි නාට්‍ය ආදී අංග මෙහි දී ඉදිරිපත් කිරීමට නියමිත ය. ඔබ, මෙම ළමා සමාජයේ ලේකම් යයි සිතා අදාළ තොරතුරු, රූපවාහිනී ළමා වැඩසටහනක් සඳහා සහභාගීවීමට කරන ඉල්ලීම ද සඳහන් කරමින් කොළඹ 07, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ ළමා වැඩසටහන් අධ්‍යක්ෂ වෙත යවන ලිපිය ලියන්න. (වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.)

නැතහොත්

සඳරුස්ගම ඥානෝදය මහා විද්‍යාලයේ වාර්ෂික නිවාසාන්තර ක්‍රීඩා උළෙල උත්කර්ෂවත් අයුරින් පැවැත්වීමට කටයුතු සංවිධානය වෙමින් පවතී. ඒ සඳහා සුදුසු න්‍යාය පත්‍රයක් සකස් කරන්න.

(වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.)

(ලකුණු 15යි.)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 10 - ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය - III

නම/විභාග අංකය :- ........................................................... කාලය: පැය 02 යි.

(01) **(i)** සිට **(x)** තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නො ලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) (අ) පන්සිය පනස් ජාතක පොත සඳහා මූලාශ්‍රය කොට ගත් ග්‍රන්ථය කුමක් ද?
(ආ) ජාතක කතා අතර දීර්ඝතම ජාතක කතාව නම් කරන්න.

(ii) (අ) කල්පනා ලෝකය, සාහිත්‍ය විද්‍යාව යන කෘතිවල කතුවරයා කවරෙක් ද?
(ආ) එම කතුවරයා විසින් විරචිත ස්වයං ලිඛිත චරිතාපදානය කුමක් ද?

(iii)
............................................................................
............................................................................
**පුරඹර** වසමින් සිටි රඟ කුම් වැනි
සුර සෙනඟට **සුරසුන්** පැනවූ වැනි

(අ) මෙම කවියේ මුල් පේළි දෙක සම්පූර්ණ කරන්න.
(ආ) මෙහි තද කළු අකුරින් මුද්‍රිත පද දෙකේ අර්ථ වෙන වෙන ම දක්වන්න.

(iv) "මෙකී තුනින් මට යමක් රුචි වී නම් ඒ දෙමි."
(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?
(ආ) මෙහි සඳහන් දේවල් දෙන බව පවසන්නේ කවර කරුණක් ඉටු කළහොත් ද?

(v) (අ) ටිබෙට් ජාතික එස්. මහින්ද හිමියන් විසින් රචිත මුල් ම කාව්‍ය ග්‍රන්ථය නම් කරන්න.
(ආ) උන් වහන්සේ විසින් රචනා කළ ජාතිකාභිමානී කෘති දෙකක් ලියන්න.

(vi) (අ) එච්. එම්. කුඩලිගම කවියා කිනම් කවියකුගේ නිර්මාණවල ආභාසය ලැබුවේ යැ'යි ඔහු සඳහන් කරන්නේ ද?
(ආ) කුඩලිගමයන්ගේ සමකාලීන කවීන් දෙදෙනෙකු නම් කරන්න.

(vii) (අ) ගුත්තිල කාව්‍යයේ ආරම්භක පද්‍යය කිනම් ගණයකින් ලියැවී ඇත් ද?
(ආ) ගුත්තිල කාව්‍යය රචනා කරන ලෙස ආරාධනා කරනු ලැබුවේ කවුරුන් විසින් ද?

(viii) (අ) ජනකවියට දිගු ඉතිහාසයක් ඇති බව කියැවෙන කෘතිය කුමක් ද?
(ආ) 'හානා හීය පානා අඬහැරෙන් දැනේ' කිනම් ජනකවි ප්‍රභේදයකට අයත් ද?

(ix) "උඹ ගමට පලයන්. මිනිහෙක් නාකි උණායින් පස්සෙ ඒවායෙ ඉඳල වැඩක් නැහැ."
(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?
(ආ) ඉහත ප්‍රකාශය අසා සිටියේ කවරෙක් ද?

(x) පහත සඳහන් පද්‍යයේ ඉතිරි පේළි දෙක ලියන්න.
ඉටු කොට කළ යුතු යුතුකම්
ලැබුණත් ලෝකෙන් ගැරහුම්
(අ) ..................................................................
(ආ) .................................................................. (ලකුණු 02 × 10 = 20යි)

(

(02) පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට **කෙටි උත්තර** ලියන්න.

(i) "කේවට්ටයෝ ද 'මහෞෂධ පණ්ඩිතයන් දැන් එති, දැන් එති' මහ බෝසතාණන් වඩනා පෙර මඟ කර ඔසව-ඔසවා බලාගෙන සිටීමෙන් කොක් කරක් සේ දික් වූ කර ඇති වූහ."

(අ) ඉහත උද්ධෘත පාඨයේ සඳහන් වන ආකාරයට කේවට්ටාචාරී, මහෞෂධ පඬිතුමාගේ පැමිණීම අපේක්ෂා කළේ කුමක් සඳහා ද?
(ආ) උද්ධෘත පාඨයේ සඳහන් උපමාවක් උපුටා ලියන්න.

(ii)
**තත** මතු ද සින්දේ
පිළිමල් දප ද සින්දේ
**යස** දිගත ඇන්දේ
විජය සිරි සඳ ගෙන වැලැන්දේ

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.
(ආ) ගුත්තිල ඇදුරු තත සිඳීමත් සමඟ සිදු වූ එක් සිදුවීමක් සඳහන් කරන්න.

(iii)
ජාතිය රන් විමනක් වේ
ආගම මිණි පහනක් වේ
එය රැක ගන්නට මෙලොවේ
සමත් වෙතොත් පුත නුඹ වේ

(අ) මෙහි පළමු පද්‍ය පාදයේ ඇතුළත් කාව්‍යාලංකාරය උපුටා ලියන්න.
(ආ) සමස්ත පද්‍යයේ අරථය ලියන්න.

(iv) "ගං ඉවුරෙ අලි ඇට නරි අදිනවා කියල අනිත් අලි ගඟේ නාන්නේ නැතුව අරිනවා ද?"
(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් කා හට ද?
(ආ) මෙම ප්‍රකාශය කළ අය එසේ කීමෙන් අදහස් කළේ කුමක් ද?

(v)
"සියලු භෝග වස්තු ඉසුරු
හරිති නෙක් දනෝ
සව් සැප දෙන සිතුමිණ වන්
ප්‍රේමය සන්දා"

(අ) ඉහත උද්ධෘතයේ අර්ථය ලියන්න.
(ආ) මෙම පාඨය හා සම්බන්ධ අවස්ථා සම්බන්ධය ලියන්න.

(ලකුණු 04 × 05 = 20යි.)

(03) (අ) භාවිත කළ බස් වහරත්
(ආ) චරිත හැසිරවීමේ කුසලතාවත්
නිසා උම්මග්ග ජාතකයේ 'සතර කන් මන්ත්‍රණය' පාඨක සිත් ඇද බැඳ ගනී. එක් කරුණකට නිදසුන් **දෙකක්** බැගින් දක්වමින් විමසන්න.

**නැතහොත්**

(අ) අවස්ථා නිරූපණයත්
(ආ) කාව්‍යාලංකාර භාවිතයත්
විශිෂ්ට ලෙස සිදු කිරීම ගුත්තිල කාව්‍යය උසස් සාහිත්‍ය නිර්මාණයක් වීමට හේතු විය. එක කරුණකට උදාහරණ **දෙකක්** බැගින් දක්වමින් විමසන්න.

(ලකුණු 15යි.)

(04) (අ) පරිසරයේ කුරිරු බලපෑමත්
(ආ) සමාජයේ කුරිරු බලපෑමත්

නිසා බැද්දේගම ජනතාව පීඩාවට පත් වූ ආකාරය බැද්දේගම නවකතාවෙන් කියැවේ. එක් කරුණකට උදාහරණ **දෙකක්** බැගින් දක්වමින් විමසන්න.

නැතහොත්

ගංගාවේ සංගීතය පද්‍ය පන්තිය රසවත් සාහිත්‍ය නිර්මාණයක් වී ඇත්තේ,
(අ) ගඟෙහි ගමන් මඟ මිනිස් දිවියට සම්බන්ධ කර දැක්වීමත්
(ආ) කවියා යොදා ගත් බස් වහරෙහි විශිෂ්ටත්වයත් නිසාය. එක් කරුණකට උචිත නිදසුන් **දෙකක්** බැගින් දක්වමින් විමසන්න. (ලකුණු 15යි.)

- **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර ලියන්න.

(05) සිංහබාහු නාට්‍යයේ සිංහබාහුගේ චරිතයෙන් තම උරුමය සොයා යන තරුණයකු පිළිබඳ ව කියැවේ. සුදුසු නිදසුන් **තුනක්** ඇසුරෙන් මෙම කියමන පිළිබඳ ව විස්තර කරන්න. (ලකුණු 10යි.)

(06) දැයේ දරුවන් තුළ දේශාභිමානය ජනිත කරවීම 'මුනි සිරිපා සිඹිමින්නේ' පැදි පෙළේ අරමුණයි. උචිත නිදසුන් **තුනක්** දක්වමින් විමසන්න. (ලකුණු 10යි.)

(07) 'හානා හීය පානා අඬහැරෙන් දැනේ ' පැදි පෙළෙන් දැක්වෙන ජනකාව්‍ය ලක්ෂණ නිදසුන් **තුනක්** ඇසුරෙන් විමසන්න. (ලකුණු 10යි.)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 10 - ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය - පිළිතුරු

### I - කොටස

| | | | | | |
|---|---|---|---|---|---|
| (01) | - | 2 | (21) | - | 4 |
| (02) | - | 3 | (22) | - | 2 |
| (03) | - | 1 | (23) | - | 3 |
| (04) | - | 4 | (24) | - | 1 |
| (05) | - | 4 | (25) | - | 3 |
| (06) | - | 1 | (26) | - | 2 |
| (07) | - | 4 | (27) | - | 3 |
| (08) | - | 2 | (28) | - | 1 |
| (09) | - | 3 | (29) | - | 4 |
| (10) | - | 1 | (30) | - | 3 |
| (11) | - | 4 | (31) | - | 2 |
| (12) | - | 2 | (32) | - | 1 |
| (13) | - | 3 | (33) | - | 4 |
| (14) | - | 4 | (34) | - | 2 |
| (15) | - | 2 | (35) | - | 4 |
| (16) | - | 1 | (36) | - | 1 |
| (17) | - | 3 | (37) | - | 3 |
| (18) | - | 4 | (38) | - | 2 |
| (19) | - | 2 | (39) | - | 4 |
| (20) | - | 1 | (40) | - | 1 |

(ලකුණු 01 × 40 = 40 යි)

### සිංහල භාෂාව හා සාහිත්‍යය - II

1. (i) ප්‍රදානෝත්සවය, ලේඛනයක
   (ii) (අ) පිළිතුරු (ආ) පූජෝත්සව
   (iii) (අ) ප්‍රයෝජ්‍ය ක්‍රියා
   (ආ) පූර්ව ක්‍රියා
   (iv) තුරු, ඉතා, ය
   (v) (අ) විරල (ආ) සංවෘත / ආවෘත
   (vi) (අ) ශිෂ්‍යයෝ දෙදෙනෙක් ඔවුන් බේරා ගත්හ.
   (ආ) සුජාතා තොමෝ කිරිපිඬු පූජා කිරීම පිණිස ගියා ය/
   සුජාතා තුමූ කිරිපිඬු පූජා කිරීම පිණිස ගියහ.

   (vii) (අ) වසංගතය (ආ) නවීකරණය
   (viii) දී ඇති පදවල අර්ථය මතු වන සේ ව්‍යාකරණානුකූල ව ලියා ඇති වාක්‍ය සඳහා ලකුණු පිරිනමන්න.
   පැල - කුඩා ගෙය / අතු පැල
   පැළ - පැළෑටිය

(ix) (අ) අප විසින් නුඹ අගය කරන ලදහි. /ලැබුණෙහි / කෙරුණෙහි
(ආ) වෙළෙන්දා විසින් බඩු විකිණේ. / විකුණනු ලැබේ / විකුණනු ලබයි.
(x) ඕනෑ එපාකම්, දිවා රෑ

(ලකුණු 02 × 10 = 20 යි.)

(02) ලකුණු විග්‍රහය මුළු ලකුණු 25යි.
(1) සාරවත්භාවය මාතෘකාව ද ඇතුළුව = (ලකුණු 08යි)
(2) සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය = (ලකුණු 12යි)
(3) ශිල්පීය දක්ෂතා = (ලකුණු 05යි)

(03) අපේක්ෂිත ප්‍රධාන අදහස් ඃ
- ★ සිංහල භාෂා හා සාහිත්‍යය කෙරෙහි අප රටේ පවතින්නේ උදාසීන ස්වභාවයකි.
- ★ එහි අහිසි ඵල දැනටමත් සමාජය තුළ දක්න ඇත.
- ★ සාහිත්‍ය කලාවෙන් තොර වූ මිනිසා හිස් අයෙකු බව විද්වත් මතය යි.
- ★ රට තුළ විශාල අපරාධ රැල්ලක් මතු ව ඇත්තේ මිනිසුන් සාහිත්‍යයෙන් තොරවීම නිසා ය.
- ★ භාෂාව හා සාහිත්‍යය සිංහල ජාතික අනන්‍යතාවයි.
- ★ මෙම පරිහානිය නිසා අපට බසත් සාහිත්‍යයත් අහිමි වේ.

මුළු ලකුණු ප්‍රමාණය 10යි.
ලකුණු විග්‍රහය ඃ
අන්තර්ගතය - ලකුණු 06යි.
වචන ගණන - ලකුණු 02යි.
ශිල්පීය දක්ෂතා - ලකුණු 02යි.

(04) (i) පැරණි කවිසමය නොතකන පිරිසක් වීම, එහෙත් එම කවිසමයෙන් සම්පූර්ණයෙන් මිදීමට නොහැකි වීම.
(ii) දහඅට මත් සිව්පදය / සමුදුරුගොස් විරිත
(iii) ජන සාහිත්‍ය කෘතියක්
(iv) දහඅට මත් ඡන්දසට අයත් සමුදුරුගොස් විරිතට වෙනස් විරිතක් මඟින් සාර්ථක පද්‍ය නිර්මාණ බිහි වූ බව
(v) (අ) දායාදය (ආ) අතලොස්ස

(ලකුණු 2 × 5 = 10යි)

(05) ආකෘතිය ලකුණු 05යි.
අන්තර්ගතය ලකුණු 07යි.
ශිල්පීය දක්ෂතා ලකුණු 03යි.
මුළු ලකුණු 15යි.

## III පත්‍රය

(01). (i) (අ) පාලි ජාතකට්ඨ කතා
(ආ) උම්මග්ග ජාතකය
(ii) (අ) මහාචාර්ය ඒදිරිවීර සරච්චන්ද්‍රයන්
(ආ) පිං ඇති සරසවි වරමක් දෙන්නේ
(iii) (අ) වර වෙණ නද අසමින් සිත සතොසිනි
සර හැර සියොතුන් පියපත් විදමිනි
(ආ) පුරඹර-නගරයේ අහස / පුරයේ අහස
සුරසුන් - දිව්‍ය ආසන
(iv) (අ) ගඟෙන් එතෙර යාමට අවශ්‍ය ව සිටි මිනිසා
(ආ) ගඟෙන් එතෙර කළහොත්
(v) (අ) ඔබා මුතු
(ආ) නිදහසේ දැහැන, නිදහසේ මන්ත්‍රය, ලංකා මාතා

(vi) (අ) මහාකවි රබීන්ද්‍රනාත් තාගෝර්ගේ
(ආ) පී.බී. අල්විස් පෙරේරා, කපිල සෙනෙවිරත්න, මාකඳුරේ ගුණවර්ධන, මීමන ප්‍රේමතිලක, උපනන්ද බටුගෙදර ආදීහු
(vii) (අ) වායු ගණයෙන්
(ආ) සලාවත ජයපාල මැතිඳු
(viii) (අ) පරමත්ථ ජෝතිකාව
(ආ) උපදේශාත්මක ජනකවි / දැනමුතුකමට කී කවි
(ix) (අ) පුංචි මැණිකාට හිරගෙදර අසල දී හමු වූ මහල්ලා
(ආ) පුංචි මැණිකා
(x) (අ) ඉවසන්නට පුළුවන් නම්
(ආ) උඹයි මගේ පුතා උතුම්

(ලකුණු 02 × 10 = 20 යි)

(02) (i) (අ) ධර්ම යුද්ධය සඳහා
(ආ) කොක් කරක් සේ
(ii) (අ) මතු ද - පමණක් ද, යස - කීර්තිය
(ආ) විරුද්ධවාදියාගේ ආඩම්බරය සිඳ දැමීම / කීර්තිය සකල දිශාවෙහි පැතිරවීම / ජය තමා වෙත පමුණුවා ගැනීමෙන් ඓශ්වර්යය ලබා ගැනීම
(iii) (අ) රූපකාලංකාරය
(ආ) ජාතිය රන් මැඳුරකි. ආගම මැණික් පහනකි. පුත, එය රැකගත හැක්කේ නුඹට පමණි.
(iv) (අ) පුංචි රාළ / වෙදරාළ විසින් පුංචි මැණිකාට
(ආ) සැමියා පිළිබඳ ශෝක නොවී පුංචි මැණිකාට විවාහ වන ලෙස
(v) (අ) සියලු සැප සම්පත් ලබා දෙන චින්තා මාණික්‍යයක් මෙන් වූ ප්‍රේමය නිසා නොයෙක් ජනතාව (තමා සතු) සියලු සම්පත් භෝග ආදිය පවා අත් හරිති.
(ආ) සුප්පා දේවියගේ දරුවන් තම මව රජ සැප හැරදා වනයේ විසීමට හේතු විමසූ අවස්ථාවේ.

(ලකුණු 04 x 05 = 20යි.)

3, 4 එක් ප්‍රශ්නයක් සඳහා
නිදසුන් 4ක් සඳහා ලකුණු 04යි.
සමස්ත විස්තරයට 11යි.
මුළු ලකුණු 15 බැගින් x 02 = 30යි.

5, 6, 7 එක් ප්‍රශ්නයක් සඳහා
නිදසුන් 03ක් සඳහා ලකුණු 03යි.
සමස්ත විස්තරයට ලකුණු 07යි.
මුළු ලකුණු 10යි.